# අනුරාධපුර අවධියේ පාලකයින්ගේ දේශපාලන පළිගැනීම් පිළිබඳ අධ්‍යයනයක්

**වරාපිටියේ මංගල හිමි[1]* හා මන්දාරම්නුවර චන්ද්‍රානන්ද හිමි[2]**

[1] සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙණ, නුගේගොඩ.

[2] පඬුවස්නුවර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, පඬුවස්නුවර.

*mwarapitiya@yahoo.com

ප්‍රමුඛ පද : අනුරාධපුර අවධිය, උපක්‍රම, දේශපාලනික පළිගැනීම, බලය

**හැඳින්වීම**

තමන්ට එරෙහිව යම් අකටයුත්තක්, හානියක් හෝ පාඩුවක් සිදුකළ අයෙකුට එදිරි ව පෙරලා අකටයුත්තක් හානියක් හෝ පාඩුවක් සිදු කරන්නේ ද එය පළිගැනීමකි. "කෙනෙකු වරදක් කළ විට ඔහුට දඬුවම් දෙන ලෙස දේවවාදීන්ගෙන් යැදීම පළිගැනීම යි" (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, 1999). පළි ගැනීම යනු "තමන්ට කරන ලද වරදකට වරදකින් ම පිළිතුරු දීමයි" (නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂය, 2003). එනම් එකට එක කිරීමයි. මෙබඳු දේශපාලන පළිගැනීම් අතීතයේ සිට මේ දක්වා ලාංකේය සමාජයේ දැකගත හැකි ය. අතීත සමාජය වර්තමානයට සාපේක්ෂ ව දැහැමි බවට පොදු පිළිගැනීමක් පවතින අතර ඒ පිළිබඳ විමසා බැලීම මෙහි අරමුණ වේ. පළිගැනීම් සඳහා යොදන ලද උපක්‍රම හා පළිය ගත් ආකාරය විමසා බැලීම ප්‍රධාන පර්යේෂණ ගැටලුව වේ.

**ක්‍රමවේදය**

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයන මගින් මෙම පර්යේෂණය සිදුකෙරේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පැරණි ලක්දිව පාලකයන් තම දේශපාලන බලය උපයෝගී කරගෙන විරුද්ධවාදීන්ගෙන් දේශීය මෙන් ම විදේශීය වශයෙන් පළිගැනීම් සිදුකොට ඇත. පණ්ඩුකාභය, ලජ්ජිතිස්ස, අභය, චෝරනාග, ඉලනාග, ජෙට්ටතිස්ස, කාශ්‍යප, සිලාමේඝ, III උදය ආදී පාලකයන් තම දේශීය විරුද්ධවාදීන්ට එරෙහි ව දවිදේශීය රටවල විරුද්ධවාදීන්ට එරෙහිව ද පළිගැනීම් සිදුකොට ඇත. ගජබා රජතුමා චෝල දේශය ආක්‍රමණය කිරීම සහ II සේන රජතුමා පාණ්ඩ්‍ය දේශයට එරෙහි ව ආක්‍රමණයක් දියත් කිරීම ද දේශපාලනික පළිගැනීම් ය.

ලංකා ඉතිහාසයේ ලිඛිත ප්‍රථම දේශපාලන පළිගැනීම වන්නේ කුවේණියගේ නෑදෑයන් විසින් ඇය

මරණයට පත් කිරීමයි. මදුරාපුරයේ සිට ලංකාවට පැමිණි විජය කුමාරයා කුවේණියගේ අනුදැනුම පිට ලංකා පුරයෙහි යක්ෂ සේනාව ඝාතනය කළ බවත් (මහාවංසය, 1959, 48, පි). පසුව විජය කුමාරයාට ලංකාවේ අභිෂේක ලැබීමට මදුරාපුරයෙන් කුමරියක් ගෙන්වා ගත් විට කුවේණියට දරු දෙදෙනා ද රැගෙන යා යුතු බව දන්වා ඇත. එහි දී ලංකාපුරයේ අසරණ වූ කුවේණිය සම්බන්ධ ව සහෝදර යක්ෂ සේනාව තීරණය කළේ විජය හා එක්ව තම සේනාව ඝාතනය කිරීමට පියවරගත් කුවේණියගෙන් පළිගත යුතු බවයි. එහි දී යක්ෂගෝත්‍රිකයන් එකතු වී කුවේණිය ඝාතනය කරන ලදි. "ඒ යකින්න හැඳින සෙරයයි සංඥා ඇති භය වූ ලංකා පුරයෙහි යක්ෂයෝ කැළඹුණෝ ය. එක රෞද්‍ර යක්ෂයෙක් වූ කලී එක් අතුල් පහරකින්ම යක්ෂණිය මැරුයේ ය" (මහාවංසය, 1959, 46, පි).

දීඝගාමිණී සහ උන්මාද චිත්‍රාගේ පුත් කුමරා වූ පණ්ඩුකාභය කුමරු ඉපදීමට පෙර සිට ඔහුව මරා දැමීමට මාමාවරු කුමන්ත්‍රණය කළත් (මහාවංසය, 1959,55, පි) ඒවායින් මිදී තරුණ වියට පත් පණ්ඩුකාභය තමා මරණයට පත් කිරීමට උත්සාහ කරන ලද මාමාවරුන්ගෙන් පළිගත් බව සඳහන් වේ. "කුමාරයාගේ ඒ මිනිස්සු සියල්ලෝ පරසේනා මිනිසුන් වැඩි කොටසක් ද මයිලන් අටදෙනා ද මරා ශීර්ෂාරාශිය කළේ ය" (මහාවංසය, 1959, 56, පි). ක්‍රි. පූ. 119 දී මරණයට පත් වූ සද්ධාතිස්ස රජුගෙන් පසුව සිංහාසනය උරුම වූයේ සද්ධාතිස්ස රජුගේ වැඩිමහල් පුත්‍රයා වූ ලජ්ජිතිස්ස කුමාරයාට ය. එහෙත් ලජ්ජිතිස්ස කුමාරයා රෝහණ දේශයේ සිටි නිසා අගනුවර සිට ථුල්ලත්තනකුමරුට රාජ්‍යය ලබා දීමට ඇමතියන් මෙන් ම මහා සංඝයාවහන්සේ ද තීරණය කොටඇත (අනුරාධපුර යුගය, 1987, 68, පි). ථුල්ලත්තන කුමරු රජ වී දින කිහිපයකට පසු ලජ්ජිතිස්ස කුමරු රාජ්‍ය ආක්‍රමණය කොට තම රාජ්‍ය උරුමය ලබාගෙන ඇත. එහි දී තමාට සිහසුන ලබා ගැනීමට විරෝධතාව දැක්වූ භික්ෂූන් වහන්සේලාගේ පළිගැනීමක් වශයෙන් වසර තුනක් තිස්සේම වැඩිමහල් පිළිවෙළ නොදන්නා පුද්ගලයන් යැයි පවසා භික්ෂූන් වහන්සේලාට අගෞරව කොට ඇත (මහාවංසය,1959, 174 පි). මෙසේ තම දේශපාලන බලය ලැබූ විට ලජ්ජිතිස්ස රජතුමා භික්ෂූන්ගෙන් පළිගෙන ඇත. ලජ්ජිතිස්ස රජුගෙන් පසු ව රාජ්‍යත්වයට පත් වී ඇත්තේ ඛල්ලාටනාග රජු ය. එහෙත් ඛල්ලාටනාගගෙන් මහාරත්තක සෙනෙවි රාජ්‍යය පැහැර ගත්තේ ය (අනුරාධපුර යුගය, 2000, 28). ඛල්ලාටනාග රජුගෙන් පසු රාජ්‍ය උරුම වූයේ තම සහෝදරයා වූ වට්ටගාමිණී අභයට ය. එහි දී මහාරත්තකගෙන් පළිගත් අභය රජු ඔහුව මරා සිංහාසනයට පත් වී ඇත. වට්ටගාමිණී නම් කුමරු ඒ දුෂ්ට සෙනවියා මරා රජය කරවී (මහාවංසය,1959, 176, පි). එපමණක් නොව වලගම්බා රාජ්‍ය සමයේ දී දකුණු ඉන්දියාවෙන් ද්‍රවිඩයින් හත් දෙනෙකුගේ ආක්‍රමණයක් ඇති වූ අතර එහි දී වලගම්බා රජතුමා උපක්‍රමශීලීව මලය දේශයට පළා යන විටගිරි නිඝණ්ඨාරාමයේ සිටි ගිරි

නිගණ්ඨයා අපහාසාත්මක ලෙස පරිභව කොට ඇත. පළාගිය වට්ටගාමිණී අභය රජු නැවතත් සේනා සන්නද්ධ වී අනුරාධපුරයට පැමිණගිරි නිගණ්ඨයා මරණයට පත් කොට ඔහුගෙන් පළිගෙන ඇත (මහාවංසය, 1959, 177, පි).

වලගම්බා රජුගෙන් පසු රාජ්‍යත්වයට පත් වූයේ බල්ලාටනාගගේ පුත් මහාචූලික මහාතිස්ස රජතුමා ය (ශ්‍රී ලංකාවේ ඉතිහාසය 2009, 99 පි). ඔහුගෙන් පසු ව චෝරනාග රජ වූ අතර, චෝරනාග රජ වීමට පෙර උදව් නොකළ භික්ෂූන් වහන්සේගෙන් පළිගත් අතර රජ වීමට පෙර තමාට නවාතැන් නොදුන් සියලු වෙහෙර විහාර ද රජ වීමෙන් අනතුරුව ගිනිබත් කළේ ය (ශ්‍රී ලංකාවේ ඉතිහාසය, 2009, 99, පි). වලගම්බා රජු පුත් චෝරනාග යැයි ප්‍රසිද්ධ වූ කුමාර තෙමේ මාසිළු රජු දවස දාමරිකව හැසිරුණේ ය. මාසිළු රජු කලුරිය කළ කල අවුදින් රජය කරවීය. දුෂ්ඨ බුද්ධි ඇති ඒ තෙමේ තමන් දාමරික කළ යම් වෙහෙරක නිවාස නොලත්තේ නම් ඒ අටලොස් විහාර විධවංශනය කරම් (මහාවංශය, 158, පි). වලගම්බා රජුගෙන් පසු ව තමාට රාජ්‍ය හිමි නොවීම නිසා උරණ වූ මොහු රාජ්‍යත්වයට පත් වූ විට දේශපාලන බලය ලබාගෙන වෙහෙර විහාර විනාශ කොට ඇත. කණිරජානුතිස්ස රජතුමාගේ (ක්‍රි.ව. 31 - 34) රාජ්‍ය කාලයේ දී ද භික්ෂූන් වහන්සේලා රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ දියත් කොට ඇත. එහි දී රජතුමා විසින් භික්ෂූන් වහන්සේලා සැට දෙනෙකු පමණ ඝාතනය කොට ඇත (අනුරාධපුර යුගය, 1987, 70, පි). එහි දී ද තමාට එරෙහි වූවන්ගෙන් රජතුමා පළිගෙන ඇත.

දේශපාලන පිළිගැනීමක් මින් පසුව වාර්තාවන්නේ ඉලනාග රජුගේ (35 - 44) කාලයේ දී ය. ඉලනාග රජුගේ හයවෙනි රාජ්‍ය වර්ෂයේ දී තිසා වැව අසල දී ලම්බකර්ණ රාජ්‍ය වංශිකයන් රජුට කරන ලද අපහාසයක් නිසා එයට පළිගැනීමක් ලෙස සැඩොලුන්ගෙන් මෙන් ලම්බකර්ණ රාජ්‍ය වංශිකයන්ගෙන් වැඩ ලබාගෙන ඇත. එයට කිපුණු ලම්බකර්ණ රාජ්‍ය වංශිකයන් රජුගෙන් පළිගැනීමක් ලෙස රජතුමා සිරගත කළේ ය. රජුගේ මඟුල් ඇතා සිරගෙය කඩා රජු නිදහස් කරගත් අතර රජතුමා මලය රටට පැන ගියේ ය. පසුව සේනාසන්නද්ධව පැමිණ ලම්බකර්ණ රාජ්‍ය වංශිකයන්ගෙන් සිහසුන නැවතත් ලබාගෙන ඇත. එහි දී ඉලනාග රජතුමා තමාට එරෙහි ව අකටයුතු කරන ලද ලම්බකර්ණ වංශිකයන්ගෙන් පළිගෙන ඇත. ලම්බකර්ණයන් වැඩවල යෙදවීම, නාසා කැපීම, හිස ගසා දැමීම වැනි දරුණු වධ දී පළිගෙන ඇත." තොපගේ රථයේ යොදන ලද ගොන්නු ය. එහෙයින් මුන්ගේ අං සහ කුර සිඳුවැයි මෙසේ හඟවන ලද රජ තෙමේ ශීර්ෂ ඡේදනය නොකොට නාසයන් පය මහපට ඇඟිල්ල කැප්පවීය" (මහාවංසය, 2000, 165, පි). මෙසේ දරුණු වධ වේදනාවලට ලක්කොට එදිරිවාදීන්ගෙන් පළිගෙන ඇත. වංකනාසික තිස්ස රජුගේ (ක්‍රි.ව. 109-112) කාලයේ දී දකුණු ඉන්දීය ආක්‍රමණයක් ඇති වී තිබේ. එහි දී

ලක්වැසියන් පිරිසක් දකුණු ඉන්දියාවට රැගෙන ගිය අතර වංකනාසිකතිස්සගෙන් පසු ව රජ වූයේ ඔහුගේ පුත් ගජබා (ක්‍රි.ව. 112-134) කුමාරයා ය. ගජබා කුමාරයා රාජ්‍යත්වයට පත්වූ විට ඔහු විසින් දේශපාලන බලය භාවිත කරමින් දකුණු ඉන්දියාවට ආක්‍රමණයක් එල්ලකොට තම පියා කළ රැගෙන ගිය 12,000 සේනාව වෙනුවට 24,000ක් සේනාව රැගෙන පැමිණ ඇත (මහාවංසය, 1959, 196 පි).

ගජබා රජුගෙන් පසු ව දේශපාලන පළිගැනීමක් දකගත හැකි වන්නේ, ජෙට්ටතිස්ස (ක්‍රි.ව. 226-276) රාජ්‍ය අවධියේ ය. ගෝඨාභය රජුගෙන් පසු ව රාජ්‍ය උරුමවූයේ වැඩිමහළු පුත් ජෙට්ටතිස්ස කුමරුට ය. එහෙත් ඇමතිවරු ක්‍රියාකරන ලද්දේ මහාසේන නම් බාල කුමරුට රාජ්‍ය ලබා දීමට ය. මෙය දනගත් ජෙට්ටතිස්ස තමාට එරෙහි වූ ඇමතිවරු සියල්ල ඝාතනය කොට තම පියාගේ චිතකය වටා මළ සිරුරු උල තබා තමාට එරෙහි ව කරන ලද කුමන්ත්‍රණයට පළිගෙන ඇත (සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, 2005, 119,පි). ධාතුසේන (ක්‍රි.ව. 459-477) රජුගේ කාලයේ දී ද්‍රවිඩයන්ගේ පක්ෂය ගෙන සිංහල කුලීනයන් සහ සිංහල ප්‍රභූ පැළැන්තිය ක්‍රියාකොට ඇත (අනුරාධපුර යුගය, 1987, 70, පි). ධාතුසේන රජු සිංහල බලය යළිත් රජරට පිහිටවූ පසුව ද්‍රවිඩ පක්ෂය ගෙන ක්‍රියාකරන ලද සිංහල කුලීනයන්ට දඬුවම් වශයෙන් ඔවුන්ගේ ඉඩම් සන්තක කර ඔවුන්ගේ ගම් අනාරක්ෂිත කළේ ය. මෙසේ තමන්ට එරෙහි ව අකටයුතු කරන ලද පිරිස්වලට තමන්ට දේශපාලන බලය ලැබුණු පසු එදිරිවාදීකම් කොට පළිගැනීම් සිදු විය. ධාතුසේන රජුගේ දියණිය විවාහ කරගත් මිගාර විසින් අඩදබරයක දී තම බිරිඳට දඬුවම් කළ විට ඇය පිය රජුට දන්විය. මින් කෝපයට පත් ධාතුසේන රජු මිගාර කෙරෙහි වෛර බැඳගෙන මිගාරගේ මව නිරුවත් කොට පුලුස්සා තම දියණියට වූ අසාධාරණයට එරෙහි ව කටයුතු කළේ ය (සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, 2005, 170, 171, පි).

ඉන්පසු ව මිගාර විසින් ධාතුසේනගෙන් පළිගැනීමට ක්‍රියා කළ අතර, රාජ්‍ය උරුමය නැති කාශ්‍යප රජකම් පිළිබඳ බලාපොරොත්තු ඇති කරවා තමාගේ පැත්තට පොළඹවා ගත්තේ ය. තමාගේ අණසක යටතේ සිටි හමුදාව සහ ජනතාව තුළ රජුට එරෙහි ව වෛරය ඇති කළේ ය. රජු අල්වා අඳුරු බිම් ගෙයක සිරකර තබා කාශ්‍යප ලවා රජු මරණයට පත්කොට රජුගෙන් පළිගැනීමට ක්‍රියා කළේ ය (සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, 2005, 171 පි). ධාතුසේන රජුගේ පුත් මුගලන් කුමරු රාජ්‍යය අහිමි වී ඉන්දියාවට ගොස් තමාගෙන් රාජ්‍ය පැහැර ගත් කාශ්‍යපට එරෙහි ව යුද්ධ කිරීමට පියවර ගත්තේ ය. සේනාව රැගෙන දකුණු ඉන්දියාවේ සිට පැමිණි මුගලන් (ක්‍රි.ව. 495-512) තම පියා මරණයට පත් කිරීමේ සහ තම රාජ්‍ය පැහැර ගැනීමේ පළිය ගෙන ඇත්තේ කාශ්‍යප ඝාතනය කිරීමෙනි (සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, 2005, 171, පි).

අනුරාධපුර යුගයේ දේශපාලන පළිගැනීම් අතර III මුගලන් (ක්‍රි.ව. 612-623) රජු තම සෙනෙවියා වූ මලයරාජ උපායෙන් අත් පා කප්පවා මරණයට පත් කිරීම (ශ්‍රී ලංකාවේ ඉතිහාසය, 2009, 110 පි) හාළුයින් බියට පත් වූ මලයරාජගේ පුත් අසිග්ගාහක රුහුණට පලා ගොස් සේනා සංවිධානය වී පැමිණ III මුගලන් මරණයට පත්කිරීම (ශ්‍රී ලංකාවේ ඉතිහාසය, 2009, 111, පි), III මුගලන් රජුගෙන් පසු මෙසේ රාජ්‍යත්වයට පත් වූ අසිග්ගාහක හෙවත් සිලාමේඝවණ්ණ (623 - 632) රජතුමාගේ රාජ්‍ය කාලයේ දී සිරිනාග නම් සෙනවියෙකු උතුරු ප්‍රදේශය බලා ගැනීමේ කැරැල්ලක දී දේශපාලන බලයෙන් සන්නද්ධ සිටි සිලාමේඝවණ්ණ තමාට එරෙහිව කටයුතු කරන ලද සිරිනාගගෙන් පලි ගැනීමට උත්සාහ කොට සිරිනාග මරා කැරැල්ල මැඩ පවත්වා ගැනීම (ශ්‍රී ලංකාවේ ඉතිහාසය, 2009, 111, පි), II සේන (ක්‍රි.ව. 853-873) රජුගේ රාජ්‍ය කාලයේ දී ද විදේශීය රටකට එරෙහි ව ආක්‍රමණයක් දියත්කොට කිරීම, I සේන රජුගේ (ක්‍රි.ව. 833-853) රාජ්‍ය කාලයේ දී ද ලංකාව ආක්‍රමණය කළ ශ්‍රී මාර, ශ්‍රී වල්ලභ රජුගෙන් පළිගැනීමක් ලෙස II සේන රජු පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කොට ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ඝාතනය කිරීම (සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, 2005, 206, පි), අනුරාධපුර යුගය අගභාගයේ දී III උදය රජු (ක්‍රි. ව. 935 - 938) රාජ සභාව තුළ කැරලි කරන ලද ඇමතිවරුන්ගෙන් පළිගැනීමක් වශයෙන් ඔවුන් ඝාතනය කිරීම, එමෙන් ම සෙන්පතියා විසින් තම මළනුවන් මරා දැමීමේ පළිය V සේන රජු (972 - 982) සිංහාසනයෙන් පහ කිරීමෙන් ලබා ගැනීම ආදිය විශේෂිත ය.අනුරාධපුර යුගය පුරාවට ම විවිධ පාලකයන් විසින් සිය දේශපාලන බලය භාවිත කරමින් විරුද්ධවාදීන්ට එරෙහිව නොයෙකුත් අකටයුතුකම් සිදුකොට ඇති බව මෙයින් තහවුරු වන අතර මේ අතුරින් බොහෝමයක් බලය තහවුරු කරගැනීම සඳහා සිදු කොට ඇති බව පෙනේ.

### ආශ්‍රිත ග්‍රන්ථ


බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, සංස් (1959)මහාවංසය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

අමරදාස රණවීර ගුණවර්ධන (1987) අනුරාධපුර යුගය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ 07.

නිකොලොස් සී. ඩබ්ලිව්, හෙට්ටිආරච්චි එස් බී. (2005) සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, සමන් ප්‍රකාශකයෝ, නුගේගොඩ.